ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු **නොලැබේ.**

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම ලෙස එම වසරේ ජුනි 30 දිනට හිඟ ආදායම වූ රු.1,780,110,300 ක් පමණක් දක්වා තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 142(1) ප්‍රකාරව රජයට ලැබිය යුතු මුදල් හා ඒ මුදල් නිශ්චය කිරීම හා නිර්ණය කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වී නොතිබුණි.	හිඟ ආදායම් වාර්තා සකස් කිරීම සඳහා නිශ්චිත දිනකට යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා වන පහසුකම පද්ධතිය තුල නොමැති බව හා පද්ධති සංවර්ධන කටයුතු කඩිනම් කර හිඟ ආදායම් වාර්තා සකස් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.	හිඟ ආදායම නිවැරදිව වාර්තා කිරීමට සුදුසු පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

(ආ) පුනරාවර්තන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වෙනත් දීමනා (1003) වැය විෂයය සඳහා සමාලෝචිත වර්ෂය තුල දී රු.13,640,000 ක පරිපූරක ඇස්තමේන්තු ලබාගෙන තිබුණද ඒසීඒ - 2 ආකෘතියේ පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන යටතේ ඇතුලත් කර නොතිබූ අතර මුළු ප්‍රතිපාදනයම විසර්ජන පනත මගින් ලබාදුන් ප්‍රතිපාදන ලෙස දක්වා තිබුණි.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසා නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	පරිපූරක ප්‍රතිපාදන නිවැරදිව ගිණුම්වල දැක්විය යුතුය.

(ඇ) අග්‍රිම ශේෂය

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
CIGAS යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුමෙහි වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම හර ශේෂය රු.301,826,586 ක් හා බැර ශේෂය රු.510,689,556 ක් විය. CIGAS යෙදුම මගින් උත්පාදනය කරන මාසික ශේෂ පිරික්සුමෙහි වෙනත් මූලාශ්‍ර වලින් අග්‍රිම හර ශේෂය රු.1,200,000 ක් වැඩියෙන් ද බැර ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	දෙවනුව යවන ලද 2024 ජනවාරි මස ගිණුම් සාරාංශය Process නොකිරීම නිසා භාණ්ඩාගාර ගිණුම් සාරාංශය හා දෙපාර්තමේන්තු ගිණුම් සාරාංශය අතර වෙනසක් පැවතුනි.	මූල්‍ය ප්‍රකාශනවල අග්‍රිම ශේෂය මාසික ශේෂ පිරික්සුමේ ශේෂ සමඟ සැසඳිය යුතුය..

(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පාලන ගිණුම්		
මුදල් රෙගුලාසි 142(3) ප්‍රකාරව එකතු කර ගන්නා මුදල් සඳහා පාලන ගිණුම් පිළියෙල කර නොතිබුණි.	එකතු කරනු ලබන මුදල් සඳහා මු.රෙ. 142(3) ප්‍රකාරව පාලන ගිණුම (මුළු ශේෂය සඳහා) සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් සම්බන්ධයෙන් පාලන ගිණුම් පිළියෙල කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1891 අංක 16 දරණ සමිති ආඥා පනතේ 8 (1) (ඇ) වගන්තිය අනුව ලියාපදිංචි සමිතිවල වාර්ෂික වාර්තා ගොනු කිරීම සිදු කළ යුතුය. 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා සමිති 228 ක් පමණක් වාර්ෂික වාර්තා ගොනු කර තිබූ අතර ක්‍රියාකාරී සමිති කොපමණ සංඛ්‍යාවක් පවතී ද යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබීම හේතුවෙන් රජයට අය විය යුතු වාර්ෂික වාර්තා ගොනු කිරීමේ ආදායම හා හිඟ ආදායම නිවැරදිව ගණනය කිරීමට නොහැකි වී තිබුණි.	රජයට අයවිය යුතු වාර්ෂික වාර්තා ගොනු කිරීමේ ආදායම හා හිඟ ආදායම් නිවැරදිව ගණනය කිරීමට කටයුතු කරනු ලැබේ.	වාර්ෂික වාර්තා ගොනු නොකළ සමිති වලින් අයකරගත යුතු හිඟ මුදල හඳුනාගෙන ගිණුම් ගත කිරීමටත් එම හිඟ ශේෂය අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ආ)	ආදායම් සංකේත 20.03.02.10 හි 2023 වර්ෂයේ දී සත්‍ය ආදායම රු.416,478,955 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.320,000,000 ක් ද සංශෝධිත ඇස්තමේන්තුව රු.370,000,000 ක් ද වූ බැවින් පසුගිය වසරට වඩා අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සත්‍ය ආදායම රු.432,396,934 ක් එනම්, සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා සියයට 17 ක වැඩි අගයක් ගෙන තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 128 (2) (ආ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත් හැකිතාක් නිවැරදිවත් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය.	2024 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කරන විට 2024 ජුනි 30 දක්වා එකතු කළ සත්‍ය ආදායමින් 1/3 ක කොටස රු.193,856,810 කි. එය මුල් ඇස්තමේන්තුව වන රු.320,000,000 න් සියයට 60 කි. වර්ෂය තුල ම ඒකාකාරී ලෙස ආදායම ලැබීම අපේක්ෂා කල නොහැකි බැවින් එකතු කල සත්‍ය ආදායම සංශෝධිත ඇස්තමේන්තුව ඉක්මවා ඇත. ඉදිරියට හැකිතාක් නිවරදිව ආදායම් ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.	ප්‍රායෝගික තත්ත්වය සලකා බලා ආදායම් හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය.
(ඇ)	සමාගම් අරමුදලින් 2012, 2013, 2014 සහ 2020 යන වර්ෂවල දී එකතුව රු. මිලියන 5,700 ක් අත්තිකාරම් ලෙස මහා භාණ්ඩාගාරයට ලබා දී තිබුණි. එසේ වුවද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 මාර්තු 02 දිනැති ලිපිය මඟින් එම මුදල් ඒකාබද්ධ අරමුදලේ ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇති බව දන්වා තිබූ අතර සමාලෝචිත	සමාගම් අරමුදල විසින් භාණ්ඩාගාරය වෙත ලබා දුන් අත්තිකාරම් මුදලින් හිලව් කර ගත් රු.216,116,000 ක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා ඇත. මෙම හිලව් කර ගැනීම සඳහා භාණ්ඩාගාරයේ එකඟතාව ලබා	ආදායම ණය ලෙස ගිණුම්ගත කිරීමට හා හිලව් කිරීමට භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය.

වර්ෂය අවසාන වන විටත් භාණ්ඩාගාර පොත්වල ණය අත්තිකාරමක් ලෙස දක්වා නොතිබුණි. භාණ්ඩාගාරයට ගෙවිය යුතු 2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 2003.02.10 හි ආදායම වූ රු.432,232,006 ක (සමිති ආදායම හැර) මුදලින් සියයට 50 ක් එනම්, රු.216,116,003 ක් භාණ්ඩාගාර අත්තිකාරමට හිලවු කර තිබුණ ද ඒ සඳහා වූ භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.	ගැනීමට කටයුතු කරමි.	

3.2 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ඇස්තමේන්තු හැකිතාක්දුරට සම්පූර්ණව හා නිවැරදිව සකස් කර නොතිබීම හේතුවෙන් රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී වැය ශීර්ෂයේ (1506) රු. 806,538 ක් එනම්, සියයට 67 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබූ අතර ඊට හේතුව නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් බව දක්වා තිබුණි. තවද එම වැය ශිර්ෂයේ ඉතිරි ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් මාරු කර ගැනීමට හැකිව තිබියදී වෙනත් දීමනා (1003) වැය ශීර්ෂය සඳහා අවස්ථා 03 ක දී එකතුව රු.13,640,000 ක් වූ පරිපූරක ඇස්තමේන්තු ලබාගෙන තිබුණි.	2024 වර්ෂය තුළ දේපළ ණය ලබා ගැනීම සිදු වේ යැයි අපේක්ෂා කිරීම නිසා ඉතිරි ප්‍රතිපාදන මාරු නොකරන ලද අතර 2024 වර්ෂයේ ජනවාරි මස සිට වැඩි කරන ලද ජීවන වියදම් දීමනාව ගෙවීමට හා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධාරීන්ට විශේෂ දීමනාව ගෙවීමට 1003 වැය ශීර්ෂය සඳහා අමතර ප්‍රතිපාදන ලබාදී ඇත.	වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු කළ යුතුය. අත්‍යාවශ්‍ය අවස්ථා වලදී මු.රෙ.66 මාරු කිරීම් සිදුකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොවුණි.	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලැබේ. ඒ පිළිබඳ අවශ්‍ය සමාලෝචනයන් සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධති පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම**	**අනුකූල නොවීම**		
	------------	------------	-------------------	-------------------	----------
		රු.			
(අ)	සමාගම් ආඥාපනත යටතේ පනවනු ලැබූ 1964 සමාගම් (ගණන් පරීක්ෂක) නියෝග				
(i)	නියෝග 2		නියෝග යටතේ වන කාර්යයන් ඉටුකිරීමට උපදේශක මණ්ඩලයක් පත්කර නොතිබුණි.	සභාපති වශයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්, වාණිජ අධ්‍යක්ෂ, භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියකු, දේශීය ආදායම් කොමසාරිස්, ලංකා කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ සහ මණ්ඩලයේ ලේකම් වශයෙන් නමින් හෝ නිලයෙන් නිලධාරියකු යන අයගෙන් සමන්විත මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ.	සමාගම් ආඥාපනතේ නියෝග ප්‍රකාරව උපදේශක මණ්ඩලයක් පත් කළ යුතුය.

(ii)	නියෝග 5(1) ඡේදයේ (ආ), (ඇ) සහ (ඊ) වගන්ති		සුදුසුකම් ඇති අයදුම්කරුවන් වාචික පරීක්ෂණය සමත්වීම අනිවාර්ය නොවූවද 2021 සිට 2024 දක්වා සම්මුඛ පරීක්ෂණ වාර්තා පරීක්ෂාවේදී අයදුම්කරුවන් වාචික පරීක්ෂණයේ දී අසමත් වීම මත ලියාපදිංචිමට නොහැකි වූ අවස්ථා 16 ක් පැවතුණි.	පසුකාලීනව පත්කළ උපදේශක මණ්ඩලය විසින් අයදුම්කරුවන් අතරින් වඩාත් සුදුසු පුද්ගලයන් තෝරා පත්කිරීම සඳහාත් විගණකවරයෙකු ලෙස පත් කිරීමට සුදුසුද යන්න තහවුරු කිරීම සඳහාත් විගණක ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න විමසීම සිදු කොට ඇත.	සමාගම් ආඥාපනතේ නියෝග ප්‍රකාරව විගණකවරුන් ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	නියෝග 9(1)	55,200	වරලත් ගණකාධිකාරීවරයෙක් වන තැනැත්තකු ලියාපදිංචි කිරීමේ ගාස්තුවෙන් නිදහස් වුව ද නියැදි පරීක්ෂාවේ දී එවැනි අයදුම්කරුවන් 08 දෙනෙකුගෙන් එකතුව රු.55,200 ක් ලියාපදිංචි ගාස්තු ලෙස අයකර තිබුණි.	වරලත් ගණකාධිකාරීවරුන්ගේ ලියාපදිංචි ගාස්තු අය කර තිබේ නම් ඒ පිළිබඳ පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	සමාගම් ආඥාපනතේ නියෝග ප්‍රකාරව ගාස්තු අයකළ හැකි විගණකවරුන්ගෙන් පමණක් ලියාපදිංචි ගාස්තු අයකළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවෙහි වාහන 05 ක් වෙනුවෙන් රියදුරන් තුන්දෙනෙකු පමණක් අනුයුක්තව සිටි බැවින් සෑම විටම වාහන දෙකක් දෛනික	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට රියදුරන් 04 දෙනෙකු පමණක් ඇතුළත් වන අතර, පවතින පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු	දෙපාර්තමේන්තුව සඳහා ප්‍රමාණවත් රියදුරන් සංඛ්‍යාවක් අනුමත කර

රාජකාරි කටයුතු සඳහා යොදවාගත නොහැකි වී තිබුණි.	සිදුකර දෙන ලෙස ඉල්ලා 2024.05.22 දිනැතිව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපත් සහිතව කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා යවා ඇත.	ගැනීමට කටයුතු කළ යුතුය.

4.2 කළමනාකරණ දූර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1989 - 2000 කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් තිදෙනෙකුගේ එකතුව රු.109,806 ක ණය ශේෂ 2024 දෙසැම්බර් 31 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි**.**	රු. 32,540 ක් වූ හිඟ ණය ශේෂය ගිණුම් සාරාංශ මගින් නිරවුල් කිරීමටත් රු.77,266 ක් වූ හිඟ ණය ශේෂය රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසා නිරවුල් කිරීමටත් කටයුතු කරනු ලැබේ.	ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් 2024 මාර්තු 16 දින සිට 2025 මැයි 28 දින දක්වා නිවාඩු ලබා තිබූ අතර 2025 ජනවාරි දක්වා එම තනතුරෙහි වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර නොතිබුණි. තවද 2024 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන ඒකකය මිනිස් දින 243 ක් උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණද විගණන කාර්යන් සඳහා සත්‍ය ලෙස මිනිස් දින 25 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 2018 අංක 19 දරන ජාතික	ප්‍රධාන අභ්‍යන්තර විගණන තනතුරෙහි වැඩ බැලීම සඳහා සුදුසු නිලධාරියකු අනුයුක්ත කර දෙන ලෙස ඉල්ලා එවකට රේඛීය අමාත්‍යාංශය වෙත ලිපි යොමු කළද නිලධාරියකු අනුයුක්ත කරගැනීමට නොහැකි විය. දැනට රේඛීය අමාත්‍යාංශය වෙතද ඉල්ලීම් කර වැඩ බැලීම සඳහා හෝ නිලධරයෙකු අනුයුක්ත කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	අභ්‍යන්තර විගණනය අඛණ්ඩව ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතුය.

විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු ප්‍රමාණවත් පරිදි සිදු වී නොතිබුණි.

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් තමාට සහය දීම පිණිස පත් කරනු ලබන විගණන සහ කළමනාකරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් එනම්, වර්ෂයකට 4 ක් වන පරිදි පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.	ප්‍රධාන අභ්‍යන්තර විගණක වෛද්‍ය හා ප්‍රසූත නිවාඩු ලබා ගැනීම නිසා එම තනතුරෙහි රාජකාරී සිදු කිරීමට සුදුසු නිලධාරියකු අනුයුක්ත කිරීමට දෙපාර්තමේන්තුව තුල නොමැති වීම නිසා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමට නොහැකි විය. 2025 වසර තුල පැවැත්විය යුතු රැස්වීම් අවම ප්‍රමාණය නිසි පරිදි පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.	චක්‍රලේඛය ප්‍රකාරව අවම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර ගණන පැවැත්වීමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 185 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 130 ක් වූයෙන් පුරප්පාඩු 55 ක් විය.	නිත්‍ය පත්කිරීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු නොපමාව පිරවීමට කටයුතු කළ යුතුය.
(ආ) දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුර වන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට අදාලව අනුමත බඳවාගැනීමේ පටිපාටියක් අනුමත කරවාගෙන නොතිබූ අතර	නිත්‍ය පත්කිරීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරට බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගෙන නිත්‍ය නිලධාරියෙකු

	2024 ජූලි 07 දින සිට අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙකු වැඩබැලීමට පත්කර තිබුණ ද තනතුරට අදාලව නිත්‍ය පත්කිරීමක් 2025 අප්‍රේල් 30 දින වනවිටත් සිදුකර නොතිබුණි. තවද සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුර අනුමත කර තිබූ 2016 ඔක්තෝබර් 24 දින සිට 2025 අප්‍රේල් 30 දින දක්වා රාජකාරි ආවරණය සහ වැඩබැලීමට නිලධාරියෙක් පත්කර තිබුණ ද පූර්ණ කාලීනව නිලධාරියෙක් පත්කර නොතිබුණි.		පත්කර ගත යුතුය. සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුරට නිත්‍ය පත්කිරීමක් සිදු කළ යුතුය.
(ඇ)	නීති නිලධාරි තනතුර 2023 දෙසැම්බර් 28 දින සිට ද ගණකාධිකාරී තනතුර අනුමත කර තිබූ 2024 මාර්තු 19 දින සිට ද පුරප්පාඩු වී පැවතුණි.	නීති නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ නීති නිලධාරි කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම නීති නිලධාරි තනතුරට බඳවාගැනීම සඳහා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව වෙතින් අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇති අතර නොපමාව බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව.	නීති නිලධාරී තනතුර අප්‍රමාදව පිරවීමටත් ගණකාධිකාරී තනතුරට ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඈ)	ද්විතීයික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුර සඳහා අනුමත තනතුරු 10 න්, තනතුරු 08 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවතුණ අතර තනතුරේ ස්ථිරව කටයුතු කල නිලධාරීයෙකු වෙත 2028 ජනවාරි 31 දක්වා වසර 05 ක දේශීය නිවාඩු ලබාදී තිබීම හේතුවෙන් 2023 ජනවාරි 31	සමාගම් පරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් හා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද කමිටුව වෙත ඉල්ලීමක් යොමු කර ඇති අතර බඳවා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව.	දෙපාර්තමේන්තුවේ අත්‍යාවශ්‍ය තනතුරක් වූ සමාගම් පරීක්ෂක තනතුරේ සියයට 80 ක් පුරප්පාඩු පවතිද්දී නිලධාරියෙකුට වසර 5 ක දේශීය නිවාඩු ලබාදීම සම්බන්ධව නිවාඩු නිර්දේශ හා අනුමත කළ නිලධාරීන් වගකිවයුතු බැවින් ඒ

දින සිට සමාගම් පරීක්ෂක නිලධාරි තනතුරේ එක් නිලධාරියෙකු පමණක් කටයුතු කර තිබුණි.

සම්බන්ධව අවශ්‍ය පියවර ගත යුතුය. පූරප්පාඩු පුරවා ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.